විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2014

මගේ අංකය: විවැ/චක්‍රලේඛ/2014
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2014- 02- 20

ලේකම්, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්, පොලිස්පති වෙත.

**ත්‍රස්තවාදී ක්‍රියාහේතුවෙන් මියගිය සහ අතුරුදහන් වූ පොලිස් නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත යැපෙන්නන්ගේ දීමනාව ගෙවීම**

ත්‍රස්තවාදී ක්‍රියාහේතුවෙන් මියගිය සහ අතුරුදහන් වූ පොලිස් නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත යැපෙන්නන්ගේ දීමනාව ගෙවීමට රජය තීරණය කොට ඇත. මෙම යැපෙන්නන්ගේ දීමනා ගෙවීමේදී පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.

01. මියගිය/අතුරුදහන් වූ නිලධාරියා විවාහක අයෙකු වන අවස්ථාවක

1.1 වැන්දඹුව වෙත පහත සඳහන් පරිදි වාර්ෂික දීමනාවක් හිමි වේ.

| නිලය | වාර්ෂික දීමනාව |
|---|---|
| පොලිස් කොස්තාපල් | රු. 975.00 |
| පොලිස් සැරයන්/ මහ සැරයන් | රු. 1,170.00 |
| උප පොලිස් පරීක්ෂක/ පොලිස් පරීක්ෂක | රු. 1500.00 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | රු. 1,665.00 |
| සහකාර පොලිස් අධිකාරී | රු. 2,335.00 |
| පොලිස් අධිකාරී | රු. 3,000.00 |
| ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | රු. 3,335.00 |
| නියෝජ්‍ය පොලිස්පති/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | රු. 4,670.00 |

1.2 දරුවන් සඳහා

1.2.1 මව ජීවත්ව සිටීනම්

| | |
|---|---|
| අවිවාහක වයස අවු. 18 න් පහල එක් එක් පිරිමි දරුවකු සඳහා | රු. 400.00 |
| අවිවාහක වයස අවු. 21 න් පහල එක් එක් ගැහැණු දරුවකු සඳහා | රු. 400.00 |

1.2.2 මව මියගොස් ඇත්නම්

| | |
|---|---|
| අවිවාහක වයස අවු. 18 න් පහල එක් එක් පිරිමි දරුවකු සඳහා | රු. 665.00 |
| අවිවාහක වයස අවු. 21 න් පහල එක් එක් ගැහැණු දරුවකු සඳහා | රු. 665.00 |

02. මියගිය/අතුරුදහන් වූ නිලධාරියා අවිවාහක අයෙකු වන අවස්ථාවක

2.1 මියගිය නිලධාරියාගෙන් යැපුනු යැපෙමින් සිටි දෙමව්පියන් සිටීනම් රු. 1,148.00 ක් හෝ ඉහත අංක 1.1 හි සඳහන් මුදල යන දෙකෙන් වැඩි මුදල

2.1.1 මව්පිය දෙදෙනාම ජීවත්ව සිටින අවස්ථාවකදී යැපෙන්නන්ගේ දීමනාව එම දෙදෙනාට සම කොටස්වලට බෙදා ගෙවිය යුතු අතර, ජීවත්ව සිටින්නේ දෙමව්පියන්ගෙන් එක් අයෙක් පමණක් නම් සම්පූර්ණ යැපෙන්නන්ගේ දීමනාව එම තැනැත්තාට ගෙවිය යුතුය.

2.1.2 මියගිය නිලධාරියාගේ දෙමව්පියන් මියගොස් ඇති අවස්ථාවක එම නිලධාරියාගෙන් යැපෙමින් සිටි වයස අවු. 18 ට අඩු අවිවාහක සහෝදරයින්/සහෝදරියන් සඳහා රු. 375/- කි.

03. යැපෙන්නන්ගේ දීමනා ගෙවීම ආරම්භ කළ යුත්තේ අමාත්‍ය මණ්ඩලය අනුමත කළ 2014 ජනවාරි 04 වන දින සිටය.

04. කිසියම් යැපෙන්නෙකු සඳහා වන්දි විශ්‍රාම වැටුප් ගෙවන්නේ නම් එම ගෙවීම් මෙම චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක වන දින සිට නතර කළ යුතුය. එම දිනෙන් පසු එවැනි ගෙවීමක් සිදුකර ඇති විට යැපෙන්නන්ගේ දීමනාවෙන් එකී මුදල් අයකරනු ලැබේ.

05. යළි විවාහ වී ඇති වැන්දඹුවන් සඳහා යැපෙන්නන්ගේ දීමනාව හිමි නොවේ.

06. යැපෙන්නන්ගේ දීමනා ප්‍රදාන පත්‍ර මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන අතර, පහත සඳහන් පරිදි ලිපිගොනුව සම්පූර්ණ කොට එවිය යුතුය.

I. පොදු 55 අයදුම්පත
II. නිලධාරියාගේ මරණ සහතිකය
III. මූලික පරීක්ෂණ වාර්තාව හා පොලිස්පති නිගමනය
IV. විවාහ සහතිකය (නිලධාරියා විවාහක නම් පමණි)
V. යැපෙන්නන්ගේ ආදර්ශ අත්සන් පත්‍රිකා හා ඡායා රූප
VI. දරුවන්ගේ උප්පැන්න සහතික
VII. භාණ්ඩාගාර 147, 148
VIII. ප්‍රාදේශීය ලේකම් වාර්තාව

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය
03. විගණකාධිපති